35 වන පිටෙන්




සාමකාමී තත්ත්වයක් පැවැති එක්දහස් නමසිය අනූ ගණන්වල කොටි සංවිධානය කැලෑවෙන් එළියට පැමිණියේය. මා සමඟ ඉගෙනගත් සිසුන් බොහෝ දෙනෙක් සංවිධානයට බැඳුණු බව මට ආරංචි විය. ගැහැණු ළමුන්ද එකා දෙන්නා බැගින් අතුරුදහන් වන්නට විය. කාන්තාවන් ඒ වන විටත් සංවිධානවලට එක්වී කටයුතු කිරීම පිළිබඳව ජනතාව තුළ කතා බහ ඇතිවිය. යාපනයේදී උපවාස කර දිවි පිදූ තිලීපන්ගේ කාලයෙහි ක්‍රියාත්මක වූ 'සුහන්දිරප් පරවෛහල්' (නිදහස් කුරුල්ලෝ) නම් වූ කාන්තා සංවිධානය පිලිබඳවත් මම දැනගෙන සිටියෙමි. එහෙත් නිල ඇඳුම් ඇඳගෙන ආයුධ සහිතව සිටින සටන්කාමී සහෝදරියන්ව මුලින්ම දුටුවේ එක්දහස් නවසිය අනූ ගණන්වලදීය. සංවිධානවලට එක්වූ කාන්තාවන් පිළිබඳ ආරම්භ කාලයේ සමාජය ඉතාමත් අවමාන සහිතව කතා බහ කළත්, ක්‍රමයෙන් සටන්කාමී සහෝදරියන්වත් සාමාන්‍ය අයුරින් පිළිගැනීමට පටන් ගත්තේය. පරන්තන් ප්‍රදේශයේ සටන්කාමී සහෝදරියන් නතරව සිටි නිවෙස්වලට ගමේ ගැහැණු ළමුන් ගොස් ඔවුන් සමඟ ආශ්‍රය කරන්නට වූවෝය. එම සහෝදරියන්ද අප මෙන්ම වුවත් ඔවුන්ගේ ගාම්භීර ජීවිතය මා තුළ ද ආකර්ශණයක් ඇති කළේය. ඔවුන් සමඟ මිත්‍රත්වයක් ඇති කර ගැනීමට මම මහත් ඇල්මක් දැක්වූයෙමි. දිනක් මම පාසල් මිතුරියන් සමඟ ඔවුන්ගේ කඳවුරට ගොස් සිටි මොහොතේ එහි පැමිණ සිටි මගේ නැගණියව දැක මම කම්පනයට පත්වූයෙමි. ගෙවල්වල අයට හොරෙන් දෙදෙනාම කිරීමට උත්සාහ කළ නිර්භීත ක්‍රියාව හෙළිවීය. නිවසෙහි අය සමඟ මේ පිළිබඳව පවසන්නේ නැති බවට දෙදෙනාම ගිවිසුමකට පැමිණියෙමු.

කොටි සංවිධානයෙහි ශිෂ්‍ය අංශයෙහි රැස්වීම් අපේ පාසලෙහි නිතර නිතර පැවැත්විණි. 'ඔබලා සියලු දෙනාම අරගල කරන්ඩ සංවිධානයට බැඳෙන්න අවශ්‍ය නැහැ. ශිෂ්‍ය සංවිධානයට බැඳිලා ඔබලාගේ අධ්‍යාපන කටයුතු කරගෙන යන අතරේම අරගලය සඳහා සහයෝගය දක්වන්නත් පුලුවන්'' යැයි යන අදහස ඉදිරිපත් කරමින් ශිෂ්‍ය සංවිධානය පිහිටුවීය. අපේ පාසලේ ශිෂ්‍ය සංවිධානයේ නායිකාව ලෙස මාව තෝරා පත් කර ගත්තේය. ප්‍රේමදාස ආණ්ඩුව සමඟ වූ කොටි සංවිධානයේ සාමය බිඳවැටෙමින් පැවතියේ මෙම වකවානුවේදීය. ජනතා නැගිටීමේ වැඩසටහන් සහ ශිෂ්‍ය පෙළපාලි බොහෝ ලෙසින් සංවිධානය කෙරුණි. අපේ පාසලේ සිසුහුද ඒවාට සම්බන්ධ වු අතර, අපි මහත් උද්යෝගයෙන් සහභාගි වී උද්ඝෝෂණය කළෙමු. 'ශිෂ්‍ය බලවේගය-මහ බලවත් බලවේගය', 'පෑන් දරන අත් තුවක්කු දරන අත් බවට පත් නොකරනු' යන සටන් පාඨ අපේ හැඟීම් උත්සන්න කිරීමට සමත් විය. ශිෂ්‍ය සංවිධාන නියෝජිතයන් වශයෙන් අපි විමුක්ති කොටි සංවිධානයේ සියලුම මහජන රැස්වීම්වලටත් මහජන නැගිටීම් වැඩසටහන්වලටත් සහභාගි වූවෙමු.



අනූව දශකයෙහි අග භාගයේ දී නැවතත් ලංකා හමුදාව සහ කොටි අතර යුද්ධය ආරම්භ විය. කොක්කාවිල් සහ මාන්කුලම් යන හමුදා කඳවුරු ප්‍රහාරයට ලක්වූ අතර, යාපනය කොටුවේ කොඩි එසවීය. කොටින්ගේ මෙම ප්‍රහාරක ජයග්‍රහණ ජනතාවගෙන් විශාල අනුග්‍රහයක් කොටි සංවිධානයට ලැබීමට හේතු වීය. ජයග්‍රාහී වීරයන් ලෙස සංවිධානයේ සටන්කාමීන් ප්‍රසංශාවට ලක්විය. එම කාලය තුළ නිකුත් වූ සංවිධානයේ විමුක්ති ගී වූ 'ඉන්ද මන් එංගලින් සොන්ද මන්' (මේ බිම අපට උරුම බිමයි) එදිරිකලින් පාසරයෙත් තේවිප් ජෝකිරෝම් (සතුරු කඳවුරු සොයාගෙන යමු) යනාදී ගීත තරුණ තරුණියන්ගේ හැඟීම් අවදි කිරීමට සමත් විය. සංවිධානය වෙත තරුණ තරුණියන් ඇදී ගියේ දහස් ගණනින්ය. 1991 වසරෙහි පැවැත්වීමට නියමිතව තිබූ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය පැවැත්වීමට හැකි වාතාවරණයක් නොමැති බව පවසා කල් දැම්මේය. එම වසරේ සත්වෙනි මාසයේදී අලිමංකඩ හමුදා කඳවුරට කොටි සංවිධානය මුහුදෙන් සහ ගොඩබිමෙන් ප්‍රහාර ආරම්භ කර තිබුණි. පරන්තන් ප්‍රදේශයෙහි ජනතාව සියලු දෙනා අවතැන්ව ගියෙන් අපේ පවුල්වල අය ද නිවස අතහැර ධර්මපුරම් වෙත ගියෝය.

ශිෂ්‍ය ව්‍යාපාරය මාර්ගයෙන් කොටින් බොහෝ පසුබිම් වැඩ කටයුතු කරගෙන යන ලදි. ජනතාවගෙන් වියලි ආහාර ද්‍රව්‍ය එක්රැස් කිරීම, තුවාල ලැබූ සටන්කාමීන්ට උවටැන් කිරීම, මවුපියන් වෙත බාරදීමට නොහැකිව පවතින මියගිය සටන්කාමීන්ගේ මෘත දේහ සඳහා මල් මාල බැඳීම ආදී වශයෙන් විවිධ වැඩ කටයුතු සිසුන් වෙත පැවරිණි. අපගේ පාසලේ තූර්ය වාදක කණ්ඩායමෙහි නායිකාව ලෙස මම කටයුතු කළෙමි. මිය ගිය කොටි සාමාජිකයන්ට අවසන් ගෞරව දැක්වීමේදී සංගීතය සැපයීම සඳහා අපගේ තූර්ය වාදක කණ්ඩායම කැඳවාගෙන ගියේය. සුසාන භූමියට කාන්තාවන් නොයෑම සාමාන්‍ය සම්ප්‍රදායයි. එහෙත් අපි මියගිය සටන්කාමීන්ගේ සුසාන භූමිවලට ගියෙමු. අරගලයේදී මියගිය වෙනත් දිස්ත්‍රික්කවලට අයත් සටන්කාමීන්ගේ මළ සිරුරුවලට ගිනි දල්වන ලද්දේ සහෝදර සටන්කාමීන් විසිනි. එම දර්ශන මගේ සිත දැඩි ලෙස කම්පනයට පත් කිරීමට හේතු විය.

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව දිනපතා සිය ගණනින් තරුණ තරුණියන් ජීවිත පූජා කරමින් සිටි තත්ත්වයක් යටතේ හුදෙක් ප්‍රේක්ෂකයෙක් ලෙස සිටීම පිළිබඳ මා තුළ වැරදි හැඟීමක් ඇති වී තිබුණි. තවදුරටත් ඉගෙන ගැනීමට හැකි පරිසරයක් උදාවනු අතැයි මම නොසිතුවෙමි. දිවා රෑ මා දුටු දර්ශන මගේ මතක ආක්‍රමණය කරමින් තිබිණ. පවුලකින් එක් අයෙක් හෝ අරගලයට එක්වුව හොත් ඉතිරි සහෝදර සහෝදරියන්ට හෝ සැනසීමේ ජීවත්විය හැකිය යනුවෙන් විශ්වාස කළෙමි. මගේ බාල සහෝදර සහෝදරියන් අරගලයට ගොස් මෙවැනි මරණයක් ඔවුන්ට අත්වෙනවා වෙනුවට මම අරගලයට එක්වීම නිවැරදිය යන තීරණයට එළැඹියෙමි. මෙම විපතෙහි දී අනෙක් අයගෙන් උපදෙස් ලබාගත යුතු යැයි මම කිසිසේත්ම නොසිතුවෙමි.

අම්මාගෙන් සහ සහෝදර සහෝදරියන්ගෙන් වෙන්වීම මහත් දරුණු වේදනාවක් විය. නැවතත් ජීවිතයේදී ඔවුන්ව හමුවිය නොහැකිය යන සිතිවිල්ල මා තුළ ඇතිවිය. සවස පන්තියට යන බවට අම්මාට බොරුවක් කියා මම මගේ පාපැදිය රැගෙන පිටත් වුවෙමි. කිලිනොච්චියේ කනකපුර පිහිටා තිබුණු සටන්කාමී සහෝදරියන්ගේ කඳවුරට ගිය මම මාව සංවිධානයට එක්කර ගන්නා මෙන් ඉල්ලා සිටියෙමි. ඒ වන විට මා මෙන් සංවිධානයට බැඳුණු සියයකට අධික ගැහැණු ළමෝ අඹ ගස් යට වාඩි වී උන්හ. ඔවුහු පුහුණුව පිණිස සංගුපිටිය පාරෙන් යාපනයට පිටත් කිරීමට කටයුතු සූදානම් කර තිබුණි. මම පැළඳ ගෙන සිටි කරාඹු ජෝඩුව සහ ඔරලෝසුව ගලවා භාරකරු වෙත දුන්නෙමි. ඒවා ඔවුහු අම්මා වෙත භාර දෙන බව පැවසූහ. කෙටි ලිපියකුත් අම්මා වෙත ලියා භාර දී මම නවක සටන්කාමී කණ්ඩායම සමඟ එක්වූයෙමි.

ඒ අනුව 1991 ජූලි 29 වන දින මම විමුක්ති කොටි සංවිධානයෙහි සටන්කාමී සාමාජිකාවක් බවට පත් වූවෙමි. එවක පැවැති වාතාවරණය තුළ වෙනත් කිසිම විකල්ප තේරීමක් තිබුණු බවක් මා දැන සිටියේ නැත. මගේ ජීවිතයෙහි නිවැරදි තීරණයක් ගත්තෙමි යැයි මම විශ්වාස කළෙමි. අපේ වැඩිහිටි දේශපාලන නායකයන් වේදිකාවේදී සිදුකළ යුද්ධ ප්‍රකාශයන්ට තරුණ පරම්පරාවේ ජීවිත යුද්ධය නම් යාග ගින්නට බිලිවෙමින් තිබුණි. දහස් ගණනක තරුණ පරපුරක් එම ගින්දර තුළ ආවේශයකින් ගමන් කරමින් සිටියෝය.

**මතු සම්බන්ධයි**

**Alpha Academy 2017**
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

**To request an application, please text student name, Class and school to**
**0457908918**

**JAPANESE**
By a qualified experienced teacher with proven results

**PREP to VCE**

- **Rapid Learning Strategies**
- **Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.**
- **Exam Revision and Preparation for VCE written and oral exam.**

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University) , B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.

**Contact Number: 0425 396 975**